# සතොස

ලංකා සතොස ලිමිටඩ් රට පුරා පිහිටි සිය වෙළඳ ජාලයෙහි සංවිධානයට නායකත්වය දීම සඳහා කාර්යශූර පුද්ගලයින් සොයනු ලැබේ. ලංකා සතොස යනු රාජ්‍ය අංශයේ විශාලතම වෙළඳ ජාලය වන අතර 2022/23 දී එහි මාවත සහ ආදායම නවීකරණය කර වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

## සහකාර ගණකාධිකාරී (JM-1-1)

**සුදුසුකම්:**
**බාහිර අපේක්ෂකයින්. (පහත 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් ගණකාධිකරණය/මූල්‍ය කළමනාකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මූලික උපාධියක් ලබා තිබීම.
2. විෂය ක්ෂේත්‍රයට අදාළ පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම මට්ටමේ *(Intermediate Level)* වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2 හෝ 3)**

1. ඉහත දැක්වෙන බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ *MA-4* කාණ්ඩයේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ *MA* 1-2 කාණ්ඩයේ *II* ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වයස**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**වැටුප් හා අනෙකුත් දීමනා :**

*JM 1-1 රු. [42,600 – 10 X 755 – 18 X 1,135 – 70,580]*

මූලික වැටුප රු. 42,600.00.
(මීට අමතරව රජයේ චක්‍රලේඛ වලට අදාලව තනතුරට අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ)

## ගණකාධිකාරී (MM-1-1)

**සුදුසුකම්:**
**බාහිර අපේක්ෂකයින්. (පහත 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් මූල්‍ය කළමනාකරණය/ ගණකාධිකරණය/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ හෝ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ මූලික උපාධියක්,
   සමඟ
   තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද
2. විෂය ක්ෂේත්‍රයට අදාල පිළිගනු ලැබූ වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම මට්ටමේ *(Intermediate Level)* වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.
   සමඟ
   තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක පශ්චාත් සුදුසුකම් සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත දැක්වෙන බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.
2. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ සහකාර කළමනාකරණ මට්ටමේ *(JM)* තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර

**වයස**

අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ)

**වැටුප් හා අනෙකුත් දීමනා :**

*MM 1-1 රු. [53,175 – 10 X 1,375 – 15 X 1,910 – 95,575]*

මූලික වැටුප රු. 53,175.00
(මීට අමතරව රජයේ චක්‍රලේඛ වලට අදාලව තනතුරට අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ)

## ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී (HM-1-1)

**සුදුසුකම්:**
**බාහිර අපේක්ෂකයින්. (පහත 1 හෝ 2)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පිළිගත් ගණකාධිකරණය/ වාණිජ/ මූල්‍ය කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ මූලික උපාධියක්,
   සමඟ
   තනතුරට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් (*Masters*) හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (*Associate Membership*) ලබා තිබීම.
   සහ
   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සභාර් කළ සේවා වාර්තාවක් සමඟ
   "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද සහ ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය (*Full Membership*) ලබා තිබීම
   සහ
   සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පුද්ගලික ආයතනයක සභාර් කළ සේවා වාර්තාවක් සමඟ
   "කළමනාකරණ මට්ටමේ" තනතුරක අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද සහ ඉන් වසර පහක් (05) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත දැක්වෙන බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ *MM* කාණ්ඩයේ *I* ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වයස**

අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ)

**වැටුප් හා අනෙකුත් දීමනා :**

*HM 1-1 රු. [80,295 – 15 X 2,270 – 114,345]*
මූලික වැටුප රු. 80,295.00
(මීට අමතරව රජයේ චක්‍රලේඛ වලට අදාලව තනතුරට අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ)

**පත්වීමේ ස්වභාවය**

ස්ථිර පත්වීමකි. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට හිමිකම් ඇත.

**සුදුසුකම්ලත් අයදුම්කරුවන්,**

- දක්ෂ අගැයුම්කිරීමේ, සමාලෝචනය කිරීමේ, අර්ථ නිරූපණය කිරීමේ හැකියාව, විශිෂ්ඨ විශ්ලේෂණාත්මක ගැටළු විසඳීමේ සහ සංවිධානමය කුසලතා සමඟ ඉහළ ස්වයං අභිප්‍රේරණයක් සහිත පුද්ගලයෙකු විය යුතුය.
- ඉහළ නායකත්ව ගුණාංග, අන්තර් පුද්ගල සන්නිවේදන හැකියාවන්ගෙන් යුක්ත විය යුතුය.
- ප්‍රශස්ත මට්ටමේ තොරතුරු තාක්ෂණ හැකියාවෙන් යුක්ත විය යුතුය.
- බහුවිධ කණ්ඩායම් වලට නායකත්වය ලබාදීමේ සහ මෙහෙයවීමේ සනාථ කළ හැකියාව තිබිය යුතුය. මානව සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමණාකරණයට හා නිසි ලෙස යෙදවීමට පළපුරුද්ද තිබිය යුතුය.

**සෑම අයදුම්කරුවෙකුම,**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

ඔබට නියම සුදුසුකම් හා පළපුරුද්ද ඇතිනම්, ඔබගේ ජීවදත්ත ලේඛනය, සහතික වල ඡායා පිටපත් සමඟ මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කරන්න. නැතිනම් **vacancies@lankasathosa.org** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කරන්න (ඉල්ලුම් කරනු ලබන තනතුර ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි / විද්‍යුත් තැපැල් පණිවුඩයෙහි **"subject"** තීරුවෙහි සඳහන් කළ යුතුය).

**(ආයතනය ලිපි ගනු දෙනු කරනු ලබන්නේ ලේඛන ගත තෝරාගත් අයදුම්කරුවන් සමඟ පමණි.)**

වෙළඳ අමාත්‍යංශය

සභාපති,
ලංකා සතොස ලිමිටඩ්, සතොස මහලේකම් ගොඩනැගිල්ල,
අංක. 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02

සතොස